සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2024 ජනවාරි

## (204) ව්‍යාපාර කළමනාකරණය

(Business Management)

2024-02-11
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයකම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, ආයතනයක ප්‍රතිලාභවල අභ්‍යන්තර තීරකයක් වන්නේ කුමක් ද?

(1) රටෙහි ජීවන වියදම. (2) රැකියාවේ වටිනාකම.
(3) ශ්‍රම වෙළෙඳපොළ තත්ත්වයන්. (4) ආර්ථික තත්ත්වය.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, සංවිධානයක මෙහෙයුම් කළමනාකරණයේ ප්‍රධාන කාර්යයක් වන්නේ කුමක් ද?

(1) වෙළෙඳ ප්‍රචාරණ වැඩසටහන් සංවර්ධනය කිරීම.
(2) සේවක ප්‍රතිලාභ සහ වැටුප් කළමනාකරණය කිරීම.
(3) සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීම සහ භාණ්ඩ හෝ සේවා සැපයීම සහතික කිරීම.
(4) වෙළෙඳපොළ පර්යේෂණ සහ විශ්ලේෂණ සිදුකිරීම.

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, සඵලදායි බණ්ඩනය (segmentation) සඳහා අවශ්‍යතාවයක් වන්නේ කුමක් ද?

(1) වෙන්කොට හඳුනාගත හැකි බව. (2) මැනිය හැකි බව.
(3) ප්‍රමාණවත් බව. (4) ඉහත සඳහන් සියල්ලම.

1.4 රුකියාවේ යුතුකම්, වගකීම්, වාර්තා කිරීමේ සම්බන්ධතා, රැකියා කොන්දේසි සහ සුපරීක්ෂණ වගකීම්වල ලැයිස්තුවක් හඳුන්වනු ලබන්නේ:

(1) රුකියා විස්තරය ලෙසයි. (2) රුකියා විශ්ලේෂණය ලෙසයි.

(3) රුකියා පුළුල් කිරීම ලෙසයි. (4) රුකියා පෝෂණය ලෙසයි.

1.5 ව්‍යාපාර මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය, සඵලදායිතාවය සහ ඵලදායිතාවය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න:

(1) සඵලදායිතාවය, ඵලදායිතාවයට සමාන වන අතර, කාර්යක්ෂමතාවය ළඟාකර ගැනීම සඳහා මේ දෙකම අත්‍යවශ්‍ය වේ.

(2) කාර්යක්ෂමතාවය, නාස්තිය අවම කිරීම සහ නිමැවුම උපරිම කිරීම කෙරෙහි අවධානය යොමුකරන අතර, සඵලදායිතාවය නිවැරදි අරමුණු සාක්ෂාත් කරගැනීම අවධාරණය කරන අතර, ඵලදායිතාවය වන්නේ යම් නිශ්චිත කාලපරිච්ඡේදයක යෙදවුම සහ නිමැවුම අතර සම්බන්ධතාවයයි.

(3) ව්‍යාපාර මෙහෙයුම්වලදී, සඵලදායිතාවය පිළිබඳව මූලිකවම සලකා බලනු ලබන අතර, කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය පිළිබඳව දෙවනුව සළකා බලයි.

(4) ඵලදායිතාවය මගින් සම්පත් ප්‍රශස්තකරණය සහතික කරනු ලබන අතර, කාර්යක්ෂමතාවය සහ සඵලදායිතාවය ව්‍යාපාර මෙහෙයුම්වලදී සම්බන්ධ නොවන සංකල්ප වේ.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

*අංක 1.6 සිට 1.10 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුළ දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

1.6 ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සම්පත් සම්බන්ධීකරණය සහ අධීක්ෂණය …………………… *(කළමනාකරණයේ / අලෙවිකරණයේ)* ඇතුළත් වේ.

1.7 …………………… *(උප කොන්ත්‍රාත්තු ලබා දීම / සේවය අවසන් කිරීම)* මානව සම්පත් අතිරික්තය සඳහා උපායමාර්ගයකි.

1.8 …………………… *[වෙළෙඳපොළ සංවර්ධනය / වෙළෙඳපොළට කිඳා බැසීම (Market penetration)]* යනු පවතින වෙළෙඳපොළ තුළ පවතින භාණ්ඩ හා සේවා සඳහා වැඩි වෙළෙඳපොළ කොටසක් ලබා ගැනීමයි.

1.9 …………………… *(පාරිභෝගික තෘප්තිය / කොටස්හිමියන්ගේ තෘප්තිය),* ජපන් කළමනාකරණ ශෛලියේ (Japanese Management Style) ලක්ෂණයකි.

1.10 …………………… *(පරිවර්තනීය / උපායමාර්ගික)* වෙනස, සංවිධානයේ අරමුණු, මෙහෙවර, පාරිභෝගික වර්ධනය, ගුණාත්මකභාවය, නවෝත්පාදන, ආදිය වෙනස් කිරීම පිළිබඳ සලකා බලනු ලැබේ.

(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 05)

*අංක 1.11 සිට 1.15 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 හොඳ උපායමාර්ගයක (good strategy) ලක්ෂණ දෙකක්(02) හඳුනා දක්වන්න.

1.12 මානව සම්පත් කළමනාකරණයේ අරමුණු දෙකක්(02) සඳහන් කරන්න.

1.13 සංවිධානයක සැපයුම් දාමය කළමනාකරණය කිරීම සඳහා උපායමාර්ග දෙකක්(02) සඳහන් කරන්න.

1.14 උපායමාර්ගික සැලසුම්කරණ ක්‍රියාවලියේදී පරතර විශ්ලේෂණය (GAP analysis) යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

1.15 වෙනසට ඇති ප්‍රතිරෝධයන් මැඩපැවැත්වීම සඳහා නිර්දේශිත ක්‍රියාවන් දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)
(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

# B කොටස

(මුළු ලකුණු 50)

## 02 වන ප්‍රශ්නය

ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සම්පත් සැලසුම් කිරීම, මෙහෙයවීම, නායකත්වය දීම සහ පාලනය කිරීමේ වගකීම කළමනාකරුවන් සතුවන අතර, නවීන ව්‍යාපාරවල ඔවුන් විසින් තීරණාත්මක කාර්යභාරයන් ඉටුකරනු ලබයි. ව්‍යාපාර සාර්ථක කර ගැනීම සඳහා බාහිර පරිසරයේ සිදුවන වෙනස්වීම්වලට අනුගත වෙමින් සඵලදායී තීරණ ගැනීම සහතික කිරීමට ඔවුන් බැඳී සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංවිධානයක කළමනාකරුවෙකු විසින් ඉටුකරනු ලබන ප්‍රධාන කළමනාකරණ භූමිකාවන් (roles) දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) තීරණ ගැනීමේ වැදගත්කම් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) පුද්ගලික තීරණ ගැනීමේ රාමුවට අනුව තීරණ ආකෘති දෙකක්(02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

**(**මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

සැලසුම් කිරීම යනු අරමුණු පිහිටුවීම සහ එම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාවන්, සම්පත් සහ කාලසීමාවන් තීරණය කිරීමේ ක්‍රියාවලියයි. සඵලදායී සැලසුම්කරණය මගින් තීරණ ගැනීම, සම්පත් වෙන් කිරීම සහ ඉලක්ක සපුරා ගැනීම සඳහා ව්‍යුහාත්මක රාමුවක් සපයනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සැලසුම්කරණයේ මූලධර්ම තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(b) සැලසුම්කරණ ක්‍රියාවලිය **සඳහන් කරන්න.** (ලකුණු 04)

(c) සැලසුම්කරණයේ ලක්ෂණ දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

**(**මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

නායකත්ව න්‍යායයන් යනු සඵලදායී නායකයින් බිහිවන / සංවර්ධනය වන සහ මෙහෙයවන ආකාරය පැහැදිලි කරන ආකෘති රාමුවක් වේ. මෙම න්‍යායයන් මගින් නායකත්ව ශෛලීන්, ගති ලක්ෂණ සහ හැසිරීම් පිළිබඳ අවබෝධයක් සපයනු ලැබේ. නායකත්ව න්‍යායයන් මගින් නායකත්ව සංවර්ධනය සහ සංවිධානවල සාර්ථකත්වය උදෙසා වැදගත් ඉදිරි දර්ශනයක් ඉදිරිපත් කෙරේ. තවද, සඵලදායී නායකයින් ඔවුන්ගේ යටත් නිලධාරීන් අභිප්‍රේරණය කරන අතර, සංවිධානය වෙනස් කිරීමේ නියෝජිතයින් ලෙස ක්‍රියාකරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) "ෆීල්ඩර්ගේ අවස්ථානුකූල නායකත්ව න්‍යාය (Fielder's Situational Leadership Theory)" මගින් හඳුන්වාදෙන ලද, නායකයින් වර්ග දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) නායකයෙකු ලෙස සේවකයින් අභිප්‍රේරණය කරන ක්‍රම තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

සක්‍රියව සවන්දීම, සංවේදනය සහ සන්නිවේදනය සඳහා සදුසු නාලිකා සහ මාධ්‍ය භාවිත කිරීම සඵලදායි සන්නිවේදනයට ඇතුලත් වේ. සඵලදායි සන්නිවේදනය මගින් අදහස්, හැඟීම් සහ තොරතුරු අන්‍යෝන්‍ය වශයෙන් හුවමාරු කිරීමත්, පෞද්ගලික සහ වෘත්තීය යන අංශ දෙකෙහිම සහයෝගය, විශ්වාසය සහ සුහද සබඳතා වර්ධනය කිරීමත්, ප්‍රවර්ධනය කෙරේ. එය සංවිධානයේ ක්‍රියාවලින් පාලනය සඳහා ද උපකාරී වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සඵලදායි සන්නිවේදනයේ ලක්ෂණ දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) කළමනාකරුවෙකුට තිබිය යුතු සන්නිවේදන කුසලතා දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) පාලන ශිල්ප ක්‍රම (techniques) දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

ඕනෑම ව්‍යාපාර ආයතනයකට අලෙවිකරණය ඉතා වැදගත් වේ. එය සංවිධානයකට තමන් ක්‍රියාත්මක වන වෙළෙඳපොළේ තරඟකාරී වාසි ලබාගැනීමට උපකාර වේ. තොරතුරු තාක්ෂණයේ සිදුවන වෙනස්කම් හේතුවෙන් ආයතනයක අලෙවිකරණය ඇතුළු සියලුම කාර්යයන් හට දැඩි බලපෑමක් එල්ල වී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංවිධානයකට අලෙවිකරණ මිශ්‍රයේ ඇති වැදගත්කම් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) සංවිධානයකට සන්නාමකරණයේ ඇති වැදගත්කම් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) ව්‍යාපාරයක මෙහෙයුම් කෙරෙහි නව තාක්ෂණයේ බලපෑම් දෙකක්(02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

### 07 වන ප්‍රශ්නය

**සීමාසහිත XYZ සමාගම**, අති නවීන ජංගම යෙදුම් සංවර්ධනය කිරීමෙහිලා විශේෂීකරණය වී ඇත. සමාගම, එහි සාර්ථකත්වය කරා ගමන් කිරීමේදී අලෙවිකරණය, මානව සම්පත් කළමනාකරණය, මෙහෙයුම් හා උපායමාර්ගක කළමනාකරණය යන ක්ෂේත්‍රවල විවිධ අභියෝගයන්ට සහ ඉඩ ප්‍රස්ථාවන්ට (opportunities) මුහුණදෙනු ලබයි.

තරඟකාරී වාසියක් ලබාගැනීමේ අරමුණින්, **සීමාසහිත XYZ සමාගම** විසින් පුද්ගලයින්ට පුද්ගලික මූල්‍ය කළමනාකරණය කරන ආකාරයේ විප්ලවීය වෙනසක් ඇතිකරනු ලබන නව ජංගම යෙදුමක් දියත් කරමින් පවතී. අලෙවිකරණ කණ්ඩායම විසින් ඉලක්කගත ජනතාව හඳුනාගැනීම සඳහා වෙළෙඳපොළ සමීක්ෂණ, ඉතා ඉහළ වටිනාකම් එකතුවක් (value proposition) නිර්මාණය කිරීම, බලසම්පන්න සන්නාමකරණයක් සහ ප්‍රවර්ධන වැඩ සටහනක් සකස් කිරීම ඇතුළු සම්පූර්ණ උපායමාර්ග ඇතුළත් සැලසුමක් සකස්කොට ඇත. ඔවුන් විසින් සහශ්‍රකයින් (millennial) සහ Z පරම්පරාවේ සාමාජිකයින් වෙත ළඟාවීම සඳහා සමාජ මාධ්‍ය සහ බලපෑම් කණ්ඩායම් සමඟ හවුල්කාරිත්වය (influencer partnerships) යොදා ගැනීමට සැලසුම් කරයි. ප්‍රධාන කාර්යසාධන දර්ශක සහ පාරිභෝගික ප්‍රතිපෝෂණ නිරීක්ෂණය කිරීමෙන් පසු අලෙවිකරණ කණ්ඩායම විසින් ඔවුන්ගේ ප්‍රවේශය අඛණ්ඩව වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරනු ලබයි. **සීමාසහිත XYZ සමාගමේ** වර්ධනයත් සමඟ ඔවුන්ගේ මානව සම්පත් දෙපාර්තමේන්තුව දක්ෂ සේවකයින් ආකර්ශනය කරගැනීමේ සහ රඳවාගැනීමේ අභියෝගයන්ට මුහුණපා ඇත.

**සීමාසහිත XYZ සමාගමේ** සාර්ථකත්වය උදෙසා, මෙහෙයුම් කාර්යක්ෂමව සිදුකිරීම අත්‍යවශ්‍ය වේ. මෙම තත්ත්වය තහවුරු කිරීම පිණිස ඔවුන් විසින් යෙදුම් සංවර්ධනය, තත්ත්ව පාලනය සහ පාරිභෝගික සේවා සැපයීම ස්වයංක්‍රීය කොට ඇත. ලීන් (Lean) මූලධර්ම ඔවුන්ගේ සැපයුම් දාමයට මඟ පෙන්වීම සිදුකරන අතර, නාස්තිය අවම කිරීම සහ කාර්යක්ෂමතාව උපරිම කිරීම සිදුකරනු ලැබේ. යෙදවුම්වල සුමට ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීම සඳහා තාක්ෂණික ගැටළු ක්ෂණිකව විසඳා ගැනීම සඳහා මෙහෙයුම් කණ්ඩායම, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සමීප සහයෝගයක් පවත්වාගෙන යනු ලැබේ. අධික තොග පවත්වාගෙන යාම සහ තොග හිඟවීම වැළැක්වීම සඳහා තොග කළමනාකරණය ප්‍රශස්තකොට ඇත. අති නවීන තාක්ෂණය (state-of-the-art technology) යොදා ගනිමින් **සීමාසහිත XYZ සමාගම** සිය මෙහෙයුම් අඛණ්ඩව වැඩිදියුණු කිරීමට උත්සාහ දරමින් සිටියි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත XYZ සමාගමේ** අලෙවිකරණ කණ්ඩායම විසින් හඳුනාගෙන ඇති නිශ්චිත උපායමාර්ග එම සමාගමේ ඉලක්කගත ග්‍රාහකයින් වෙත ළඟාවීම සඳහා උපකාර වන ආකාරය **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(b) **සීමාසහිත XYZ සමාගම** ට තම සේවකයින් රඳවා තබා ගැනීම සඳහා ක්‍රියාත්මක කළහැකි යෝජනා තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(c) **සීමාසහිත XYZ සමාගම** විසින් ඔවුන්ගේ මෙහෙයුම් සඳහා ඇතුළත් කර ඇති විශේෂිත ස්වයංක්‍රීය තාක්ෂණයන් තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(d) **සීමාසහිත XYZ සමාගමට,** තම තරඟකාරී වාසි සහගත තත්ත්වය පවත්වා ගැනීම සඳහා වෙනස්වන වෙළෙඳපොළ තත්ත්වයන්ට සහ තාක්ෂණික ප්‍රවණතාවයන්ට අනුගත විය හැකි ආකාර තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(e) **සීමාසහිත XYZ සමාගමට** සමස්ත තත්ත්ව කළමනාකරණය **[**Total Quality Management (TQM)**]** හරහා ලබාගත හැකි වාසි පහක්(05) **සඳහන් කරන්න.** (ලකුණු 05)

C කොටසෙහි අවසානය (මුළු ලකුණු 25)

## කළ යු... ...ිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රායෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |